ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade: 07 | විෂයය Subject: බුද්ධ ධර්මය | පත්‍රය Paper: I,II | කාලය Time: පැය 02 |

නම :- ....................................................................................... පංතිය :- ..........................

සැලකිය යුතුයි :-

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න**

## I කොටස

අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01.බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පස්වන සතිය ගත කළේ,

I. අජපාල නුගරුක මුලය.
II. ඇසතු බෝ රුක මුලය.
III. කිරිපලු නුගරුක මුලය.
IV. මිදෙල්ල ගස මුලය.

02. බුදුන් හා දහම් සරණ ගිය පළමු ද්වේවාචික උපාසකවරු වන්නේ,

I. පිප්ඵලි හා සච්චක දෙදෙනාය.
II. සුනීත සෝපාක දෙදෙනාය.
III. උපතිස්ස කෝලිත දෙදෙනාය.
IV. තපස්සු භල්ලුක දෙදෙනාය.

03. බුදුරජාණන් වහන්සේ ලෝකයේ ඇති අතීත,වර්තමාන,අනාගත යන තුන් කාලයටම අයත් සියලු දේ අත්ලෙහි වූ නෙල්ල ගෙඩියක් මෙන් මනාව දත් හෙයින්,

I. අරහං නම් වන සේක.
II. සම්මා සම්බුද්ධ නම් වන සේක.
III. ලෝකවිදූ නම් වන සේක.
IV. අනුත්තර නම් වන සේත.

04. පිරුවානා පොත් වහන්සේ තුළ ඇතුළත් තුන් සූත්‍රය වන්නේ,

I. මහා මංගල,සිගාලෝවාද,පරාභව
II. රතන සූත්‍රය,අනන්තලක්ඛන,කරණීයමෙත්ත
III. කරණියමෙත්ත,ධම්මචක්කපවත්තන,රතන
IV. මහාමංගල ,රතන සූත්‍රය,කරණියමෙත්ත සූත්‍රය

05. බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව වන්නේ,

I. වේළුවනාරාමය
II. පූර්වාරාමය
III. ජේතවනාරාමය
IV. ඝෝෂිතාරාමය

06.අනපේක්ෂිත විපත් රැසකට මුහුණ දී පසුව බුදු පිහිට ලැබූ කාන්තාව වන්නේ,

I. කිසාගෝතමිය.
II. පටාචාරාය.
III. මාගන්ධියා බැමිනියය.
IV. සාමාවතී බිසවය.

07. සිරිත් මල්දම රචනා කළේ,

I. වීදාගම මහා මෛත්‍රී හිමිය.
II. ඇස්.මහින්ද හිමිය.
III. ඇම්.ඇල්.සිල්වා ගුරු මුහන්දිරම්තුමාය.
IV. තොටගමුවේ ශ්‍රී රාහුල හිමිය.

08.කරණීයමෙත්ත සූත්‍රයෙහි තසා නමින් හැදින්වුණෝ,

I. කෙලෙස් රහිත සත්වයෝය.
II. උපන් සත්වයෝය.
III. ඇසට පෙනෙන සත්වයෝය.
IV. කෙලෙස් සහිත සත්වයෝය.

09. බුදු සසුනේ අග්‍ර දායිකාව වූයේ,

I. කිසාගෝතමීය.
II. විශාඛා සිටු දේවියය.
III. සුජාතා සිටු දේවයය.
IV. ඛේමා බිසවය.

10. ජේතවනාරාමය පූජා කළේ,

I. බිම්බිසාර රජතුමාය.
II. බරණැස් සිටුතුමාය.
III. අනේපිඩු සිටුතුමාය.
IV. ධනංජය සිටුතුමාය.

11.බෞද්ධයගේ අත්පොත වන ධම්මපදයෙහි ඇතුලත් ගාථා ගණන,

I. 465කි.
II. 455කි.
III. 423කි.
IV. 550කි

12. බුදුගුණ ගණන,

I. හයකි.
II. දහනවයකි.
III. නවයකි.
IV. විසි හතරකි.

13.මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග ඇතුලත් සූත්‍රය වන්නේ,

I. මෙත්තානිසංස සූත්‍රය
II. කරණියමෙත්ත සූත්‍රය
III. පරාභව සූත්‍රය
IV. මහා මංගල සූත්‍රය

14. මහා සුභද්‍රා,චූල සුභද්‍රා හා සුමනා යනු,

I. බිම්බිසාර රජුගේ දියණියන්ය.
II. කොසොල් රජුගේ දියණියන්ය.
III. අනේපිඩු සිටුතුමාගේ දියණියන්ය.
IV. ධර්මාශෝක රජුගේ දියණියන්ය.

15. විශාඛා මහා උපාසිකාවගේ පියා වුයේ,

I. අනේපිඩු සිටුතුමාය.
II. මිගාර සිටුතුමාය.
III. බරණැස් සිටුතුමාය.
IV. ධනංජය සිටුතුමාය.

16.බුදුරජාණන් වහන්සේගේ පිහිට ලැබූ ගිලන් ව සිටි හිමි නමක් වූයේ,

I. චුල්ලතිස්ස හිමිය.
II. පුණ්ණ හිමිය.
III. පූතිගත්තතිස්ස හිමිය.
IV. කාශ්‍යප හිමිය.

17. භාවනා කිරීමේදී කාන්තා පාර්ශවය හිඳ ගන්නා ඉරියව්ව හැඳින්වෙන්නේ,

I. බද්ධ පර්යංකය නමිනි.
II. අර්ධ පර්යංකය නමිනි.
III. එරමිණිය ගොතාගෙන නමිනි.
IV. වීරාසන නමිනි.

18.සුදත්ත නම් වූයේ,

I. අනේපිඩු සිටුතුමාය.
II. බරණැස් සිටුතුමාය.
III. ධනංජය සිටුතුමාය.
IV. කොසොල් රජතුමාය.

19.බුදුරජාණන් වහන්සේගෙන් කිඹුල්වතට වැඩම කරන මෙන් ඉල්ලා සිටියේ,

I. කාළුදායි මහරහතන් වහනසේ
II. පුණ්ණ මහරහතන් වහන්සේ
III. ආනන්ද මහරහතන් වහන්සේ
IV. සැරියුත් මහරහතන් වහන්සේ

20.කාව්‍යශේඛරය රචනා කලේ,

I. ඇස්.මහින්ද හිමිය.
II. විදාගම මහා මෛත්‍රී හිමිය.
III. තොටගමුවේ ශ්‍රී රාහුල හිමිය.
IV. පරාක්‍රමබාහු රජුය.

(ලකුණු 2 ෘ 20 = 40)

## ii කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද,අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01) කෙටි පිළිතුරු සපයන්න.

1. ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ කවුද?
2. පස්වග තවුසන් නම් කරන්න.
3. ප්‍රථම ධර්ම දේශනය කුමක්ද? දේශනා කළේ කිනම් පොහෝ දිනකදීද?
4. තුන් බෑ ජටිලයන් නම් කරන්න. .
5. බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදුවූයේ කොහේද? එහි වැඩමවීමට හේතුව කුමක්ද?
6. සංජය පිරිවැජියා සමීපයේ සිට පැමිණ බුදු සසුනේ පැවිදි වූ දෙදෙනා කවුද?
7. බුදුරජාණන් වහන්සේ පිහිට වූ අසරණ කාන්තාවන් දෙදෙනෙකු නම් කරන්න.
8. පාසලේ දි අනුගමනය කළ යුතු සිරිත් 02ක් ලියන්න.
9. උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග 02ක් ලියා දක්වන්න.
10. ප්‍රථම රහත් හැට නම නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02) 1. බුදුගුණ ඇසුරෙන් රචනා කර ඇති කාව්‍ය ග්‍රන්ථය කුමක්ද? රචනා කළේ කවුද? (ලකුණු 03)

2. නවඅරහාදි බුදු ගුණ පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 07)

03) 1. සිරිත් විරිත් පැහැදිලි කරන කාව්‍ය ග්‍රන්ථ 02ක් නම් කරන්න. (ලකුණු 02)

2. නිවසේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 03ක් ලියන්න. (ලකුණු 03)

3. විහාරස්ථානයේ දී ප්‍රදර්ශනය කළ හැකි ආදර්ශ පාඨ 05ක් ලියා දක්වන්න. (ලකුණු 05)

04) 1. මෙත් වැඩීම පිළිබඳ පැහැදිලි කරන සූත්‍රය නම් කරන්න. (ලකුණු 02)

2. මෙත් වඩන්නකු තුළ තිබිය යුතු ගුණාංග 03ක් ලියන්න. (ලකුණු 03)

3. මෛත්‍රී භාවනාව පුද්ගල හා සමාජ සුභ සිද්ධියට හේතු දෙර. කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05) 1. සත් සතිය පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 05)

2. බුද්ධ චරිතයෙන් ප්‍රකට වන සුවිශේෂී ලක්ෂණ 05ක් ලියන්න (ලකුණු 05)

06) පහත දැක්වෙන මාතෘකා අතුරින් 02කට කෙටි සටහන් ලියන්න

1.අනේපිඩු සිටුතුමා

2. විශාඛා මහා උපාසිකාව

3. ධම්මපදය

4.අසරණ සරණ ගුණය

(ලකුණු 2 x 5 = 10)